# රාජකීය විදුහල - කොළඹ 07

# අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2011

# පරිසරය - 3 ශ්‍රේණිය

නම : ...................................................................

**(01) පහත සඳහන් වැකකි හරි නම් (√) ලකුණද වැරදි නම (X) ලකුණද වරහන තුළ යොදන්න.**

1. ඇඳුමේ සාක්කුවල කුණු වැඩියෙන් තැවරේ. (..........)
2. උපකරණ නිසි තැන තැබීමෙන් කාලය ඉතිරි වේ. (..........)
3. සෝයාබෝංචි සතුන්ගෙන් ලබාගන්නා ආහාරයකි. (..........)
4. දිනපතා සමබල ආහාර ගැනීම සෞඛ්‍යයට අහිතකරය (..........)
5. නියමිත වේලාවට ආහාර ගැනීම නිසා ලෙඩ රෝග ඇතිවේ (..........)
6. ක්ලාන්ත වු රෝගියෙකුට වතුර පෙවීමට උත්සාහ නොකළ යුතුය. (..........)
7. ලංකාවේ ජීවත් වන්නේ සිංහල හා ද්‍රවිඩ ජාතීන් පමණි. (..........)
8. අතීතයේදී වැඩ පහසු කර ගැනීම සඳහා සතුන් යොදාගෙන ඇත. (..........)
9. පිසින ලද ආහාර මිලදී ගැනීමේදී කල් ඉකුත්වීමේ දිනය බැලීම වැදගත් වේ. (..........)
10. ජලය විදුලිය නිපදවීම සඳහා ආධාර කර ගනී. (..........)

(ලකුණු 1 x 10 = 10)

**(02) ගැලපෙන පිළිතුර සොයා යා කරන්න.**

| | | |
|---|---|---|
| 1. | වැල් දුවන ශාකයකි | පරිප්පු |
| 2. | හින්දු ආගමික උත්සවයකි | බුලත් |
| 3. | අපගේ වැඩීමට උපකාරී වේ | දීපවාලි |
| 4. | අපේ පාසල අවට තිබෙන පාරකි | ලුණු |
| 5. | ජලය සපයා ගන්නා ක්‍රමයකි | අඩුව |
| 6. | ජලයේ හොඳින් දියවේ | රීඩ් මාවත |
| 7. | කම්බි කැපීමට භාවිතා කරයි | වැව |
| 8. | ගෙවත්තේ පහසුවෙන් වගා කළ හැකි පලතුරකි | දුම්රිය |
| 9. | ද්‍රවිඩ ජාතික පිරිමින්ට ආවේණික ඇඳුමකි | පැපොල් |
| 10. | පොදු වාහනයකි | වේට්ටිය |

(ලකුණු 2 x 10 = 20)

**(03) නිවැරදි පිළිතුරු සොයා යටින් ඉරක් අඳින්න.**

1. නිදහස් දින උත්සවය (ජාතික / ආගමික) උත්සවයකි.
2. ජාතික ගීය ගැයීමේදී (පහසුවෙන් / සීරුවෙන්) සිටිය යුතුය.
3. මාළුවා හුස්ම ගන්නේ (වරල් / කරමල්) වලිනි.
4. (බතල / කරපිංචා) ආහාර රසවත් කිරීමට යොදා ගනී.
5. නත්තල් උත්සවය පවත්වනු ලබන්නේ (මැයි / දෙසැම්බර්) මාසයේදීය.
6. හින්දු භක්තිකයන්ගේ ආගමික ස්ථානය (කෝවිල / පන්සල) යි.

7. යම් ස්ථානයක විදුලිය තිබේද යන්න පරීක්ෂා කිරීමට (ස්ටේප්ලය / ටෙස්ටරය) භාවිතා කෙරේ.

8. පොල්තෙල් ජලයේ (පාවේ / ගිලේ)

9. (නොසැලකිල්ලෙන් / සැලකිල්ලෙන්) ක්‍රියා කිරීම නිසා තමා මෙන්ම අන් අයටද අනතුරු සිදුවිය හැකිය.

10. කැලෑ එළි කිරීම නිසා වර්ෂාව (වැඩිවේ / අඩුවේ)

11. ජංගම දුරකථන භාවිතා කරමින් ගමන් කිරීම නිසා අතරමගදී අනතුරු සිදුවිය (හැකිය / නොහැකිය)

12. බස් රථයට රෝද (හතරක් / හයක්) ඇත.

13. දාං ඇදීම ශක්තිය (වැඩියෙන් / අඩුවෙන්) වැයවන ක්‍රීඩාවකා.

14. වාහන වලින් පිටකරන කළු දුම් පරිසරයට (හිතකරය / අහිතකරය)

15. 2011 වසරේ ශ්‍රී ලාංකිකයන් විසින් සමරන ලද්දේ (62 / 63) වන නිදහස් දින සැමරුමයි.

(ලකුණු 2 x 15 = 30)

**(04) පිළිතුරු ලියන්න.**

1. ශාක වලින් ලබාගන්නා ප්‍රයෝජන 2 ක් ලියන්න.

   i) ..........................................................................................

   ii) ..........................................................................................

2. නිවෙස් ආශ්‍රිතව වාසය කරන මිනිසාට හානි කරන සතුන් බෝවීම වැළැක්වීම පිණිස ගතහැකි ක්‍රියාමාර්ග 2 ක් ලියන්න.

   i) ..........................................................................................

   ii) ..........................................................................................

3. පහත සඳහන් ආගම් වලට අයත් ආගමික උත්සවය බැගින් ලියන්න.

බෞද්ධ - ..................................................................................

ඉස්ලාම් - ..................................................................................

හින්දු - ..................................................................................

ක්‍රිස්තියානි - ..................................................................................

4. නිවසේදී භාවිතා කරන සරල යන්ත්‍ර 2 ක් ලියන්න.

i) ..................................................................................

ii) ..................................................................................

5. මනාව පවත්වාගෙන යන ගෙවත්තකින් ඉටුවන ප්‍රයෝජන 2 ක් ලියන්න.

i) ..................................................................................

ii) ..................................................................................

6. ආහාර ගැනීමේදී පිළිපැදිය යුතු සිරිත් 2 ක් ලියන්න.

i) ..................................................................................

ii) ..................................................................................

7. ජලය උරාගත් දේවල් වලින් ජලය ඉවත් කිරීමට කළ හැකි දේවල් 2 ක් ලියන්න.

i) ..................................................................................

ii) ..................................................................................

8. එදිනෙදා භාවිතා කරන පොත් පවිත්‍රව තබා ගැනීමට කළ හැකි දේවල් 2 ක් ලියන්න.

i) ...............................................................................................

ii) ...............................................................................................

9. ජලය පරිහරණය කිරීමේදී අප විසින් සැලකිය යුතු ප්‍රධාන කරුණු 2 ක් ලියන්න.

i) ...............................................................................................

ii) ...............................................................................................